හිතවත් ශ්‍රී ලාංකික මිත්‍රවරුනි,

මානව වර්ගයා, මානව ඉතිහාසයේ විශාලතම තර්ජනයකට මුහුණ දී සිටී. පසුගිය වසරේ ආරම්භ වූ COVID-19 වසංගතය මේ වනවිටත් මිලියන ගණනක් මිනිස් ජීවිත බිලිගෙන ඇති අතර සමස්ත ලෝක ආර්ථිකයම අඩපණ කර ඇත. මෙම වසංගතයෙන් ශ්‍රී ලංකාවට ද දැඩි බලපෑමක් එල්ල වී ඇත. කෙසේ වෙතත්, දෙරටේ අන්‍යෝන්‍ය සහයෝගීතාවය සහ ශක්තිමත් නායකත්වය, COVID-19 වසංගතයට එරෙහිව සටන් කිරීමට අපට උපකාරී විය.

ඉන්දියාව විශ්වාස කරන්නේ, "Vasudewa Kudumbakam - මුළු ලෝකයම අපේ පවුල" යන්නයි. ලෝකයේ ෆාමසිය ලෙස මෙම අවස්ථාවේ නැගී සිට, සමස්ත මානව වර්ගයාට ඉන්දියාව කැපවී උදව් කිරීමෙන් මෙය නැවත වරක් ඔප්පු විය. වසංගතයේ ආරම්භක කාලය තුළ ඉන්දියාව අත්‍යවශ්‍ය ඖෂධ ටොන් විසි හයක් ශ්‍රී ලංකාවට සැපයීය. පූනේහි Serum ආයතනයේ නිපදවන ලද Astrazeneca එන්නත, මේ වසරේ ජනවාරි මාසයේදී ඉන්දියාවේ 'Vaccine Maitri proggamme' යටතේ අසල්වැසි රටවලට ලබා දෙන ලදී. දෙදහස් විසි එක ජනවාරි විසි අට වන දින, ශ්‍රී ලංකාවට ඉන්දියාවේ නිපදවූ එන්නත් මාත්‍රා ලක්ෂ පහක් ලැබුණි. COVID-19 වසංගතයට එරෙහිව එන්නත් කිරීමේ වැඩසටහන ආරම්භ කිරීමට ශ්‍රී ලංකා බලධාරීන්ට මෙය ඉවහල් විය.

දෙදහස් විස්ස අප්‍රේල් මාසයේදී ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් COVAX ස්ථාපිත කරන ලද්දේ, වත්කම් නොසලකා ලෝකයේ සෑම ප්‍රදේශයකම ජනයාට COVID-19 එන්නත ලබා ගැනීම සහතික කිරීමයි. මේ වසරේ පෙබරවාරි විසි හතර වන දින COVAX පහසුකම හරහා COVID-19 එන්නත ලබාගත් පළමු රට බවට Ghana පත්විය. COVAX යටතේ Ghana රටට සැපයූ මෙම එන්නත, ඉන්දියාවේ Serum ආයතනය විසින් නිපදවන ලදී. මේ අනුව ඉන්දියාවේ නිෂ්පාදිත එන්නත, අන්තර්ජාතික COVID-19 එන්නත් කිරීමෙහිලා වූ සහයෝගිතාවයේ ඉදිරියෙන්ම සිටී. ඉන්දියාවේ නිෂ්පාදිත එන්නත් තවදුරටත් මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකා රජයේ සැලසුම් පිළිබඳව දැන ගැනීමට ලැබීම මට ඉතා සතුටට කරුණකි. ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ජනතාව සමඟ මෙම අඛණ්ඩ සබඳතාව, අප සාදරයෙන් පිළිගන්නා අතර මෙම දුෂ්කර කාලය ජය ගැනීමට අපි එක්ව සටන් කරමු.

ඔබට ස්තූතියි.